www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

0456

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு
Year End Evaluation - 2019

6 - H

| ශ්‍රේණිය / தரம் / Grade | 06 | විෂයය / பாடம் / Subject | ක්‍රිස්තියානි ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper | I ,II | කාලය / காலம் / Time | පැය 02යි. |
|---|---|---|---|---|---|---|---|

නම:-...... ...........................................

විභාග අංකය:-..........31..........

සැලකිය යුතුයි.

## I කොටස

- සියලු ම ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. දරු උපත සඳහා දේව අණට කීකරුවෙමින් මරියතුමිය රැක බලා ගත්තේ,
 1. ගාබ්‍රියල්
 2. ජෝසෙප්තුමා
 3. ස්නාවක ජොහාන් තුමා
 4. ලූක් තුමා

02. අහස් තලය දේව ..................... ප්‍රකාශ කරන්නේ ය.
 1. අත්කම්
 2. ශක්තිය
 3. මහිමය
 4. බලය

03. කුරුසි පාමුල සිට ජේසුස් වහන්සේට කවටකම් කළ පිරිසට අයත් ය.
 1. සොරුන් දෙදෙනා
 2. කිරේනියේ සීමොන්
 3. විනයධරයන්
 4. මරියාවන්

04. නව ජීවිත පැවැත්මකට නව උපතක ජීවිතයට කීකරු වූ ජනයා ස්නාවක ජොහාන්ගෙන්,
 1. බෞතිස්ම ස්නාපනය ලැබී ය.
 2. ගැලවීම ලැබී ය.
 3. අත්දැකීමේ ජීවිතයක් ලැබී ය.
 4. සේවයේ ජීවිත ලැබී ය.

05. පළමුව ජේසුස් වහන්සේ උත්ථාන වූ බව සාක්ෂි දැරූ අය වන්නේ,
 1. පේදුරු ඇතුළු ශ්‍රාවකයින් ය.
 2. එම්මාවුස් ගමට ගිය ගෝලයින් ය.
 3. තෝමස් ඇතුළු ශ්‍රාවකයින් ය.
 4. මග්දලායේ මරියා, ජෝවන්නා, ජාකොබ්ගේ මව වූ මරියා ය.

06. අතීතයේ දේව වචනය ලේඛන ගත කිරීම භාවිතා කළ කොළ වර්ගය වන්නේ,
 1. කඩදාසිය
 2. නිල් පිටපත් ය.
 3. පැපිරස් පත් ය.
 4. පුස්කොළ පත් ය.



Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

07. "ජේසුස් වහන්ස ආචාරිණි, අපට කරුණා කරන්න." මෙසේ පැවසුවේ,
1. අන්ධ බාර්තිමෙයස් ය.
2. ලාදුරු රෝගීන් දස දෙනා ය.
3. අසරණ වූ සමාරිතයා ය.
4. කොර වූ මිනිසා ය.

08. සාමුවෙල් තුළ දක්ක ගත හැකි උතුම් ගුණාංග වන්නේ,
1. කීකරුව අවවාද පිළිගැනීම.
2. සැකයෙන් විමසිලිමත් වීම.
3. පණිවිඩ අසා ඉක්මණින් ක්‍රියා කිරීම.
4. දුකින් තැවී සිටීම.

09. ජෙස්සේ ගේ පුතුන් ගණන,
1. දොළහකි.
2. හතරකි.
3. දෙකකි.
4. අටකි.

10. මිනිසා හා දෙවියන් වහන්සේ අතර සබඳතාව පෙන්නුම් කරන දස පනතේ පනතකි.
1. සොරකම් නොකරන්න.
2. රූපවලට වන්දනා නොකළ යුතු ය.
3. පියාට ද මවට ද ගෞරව කරන්න.
4. බොරු නොකියන්න.

- මෙම වාක්‍ය නිවැරදි නම් '✓' ලකුණ ද, වැරදි නම් 'X' ලකුණ ද වරහන් තුළ යොදන්න. (ලකුණු 2 x 10 = 20)

01. දෙවියන් වහන්සේ තමා මවා වදාළ සියලු දේ තරඹා ඉතා මනහර බව දුටු සේක. ( )
02. ජේසුස් වහන්සේගේ පුනරුජ්ජීවනය තුළින් අපට උරුම වන්නේ සදාතන ජීවනයයි. ( )
03. ජුදෙව් ව්‍යවස්ථාව අනුව වැඩිහිටියකු ලෙස පිළිගැණුනේ අවුරුදු දහයේ දී ය. ( )
04. "මගේ අසල්වැසියා කව්ද? යන්න ජේසුස් වහන්සේගෙන් ප්‍රශ්න කළේ විනයධරයෙකි. ( )
05 මිරියම් තම මල්ලීව පාරාවෝගෙන් රැක ගැනීමට උදව් විය. ( )
06. "ඔබේ ඇදහිල්ල ඔබට සුවය දී තිබේ" යයි ජේසුස් වහන්සේ අන්ධව සිටි බාර්තිමේයස්ට පවසන ලදී. ( )
07. උපස්ථායක පිලිප්තුමා පාවුල් තුමාගේ ජීවිතයට ආලෝකයක් ලෙස දේව වචනය පහදා දුන්නේ ය. ( )
08. ජේසුස් වහන්සේ කුරුසිය මත සටහන් කළ ප්‍රකාශය වන්නේ "ජුදෙව්වන්ගේ රජ" යන්න ය. ( )
09. දෙවියන් වහන්සේ සූර්යයා, චන්ද්‍රයා හා තාරකා මවනු ලැබුවේ තුන් වන දවසේ ය. ( )
0. නැති වූ පුත්‍රයාගේ උපමා කථාවෙන් අසීමිතව කමා කළ යුතු බව කියැවේ. ( )

(ලකුණු 2 x 10 = 20)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

## II කොටස

පළමු ප්‍රශ්නය අනිවාර්යයි. තව ප්‍රශ්න 04ක් තෝරා පිළිතුරු සපයන්න.

(01) (i) ගාබ්‍රියල් දේව දූතයා ජේසුස් වහන්සේගේ උපත පිළිබඳව එඬේරුන්ට දුන් සලකුණ කුමක් ද?

(ii) සතියේ පළමු වන දා එළිවෙන මොහොතේ සොහොන වෙත කාන්තාවන් ගියේ මන් ද?

(iii) නැතිවූ පුත්‍රගේ කථාවේ බාල පුතු හට තම පියාව හා ගෙදර මතක් වූවේ කවර අවස්ථාවේ දී ද?

(iv) ජෙරුසලම් දේව මාලිගාවට නැවත පැමිණෙන විට ජේසු කුමරු කුමක් කරමින් සිටියේ ද?

(v) දාවිත් ගෝලියත් නම් යෝධයා ඉදිරිපිටට ගියේ කුමක් රැගෙන ද?

(vi) ජීවමාන දෙවි පියාණන් හා කිතුනුවා සම්බන්ධ වන ප්‍රධාන අවිය කුමක් ද?

(vii) "මා අන් මිනිසුන් මෙන්, වස්තුවට ආශා කරන, වංචනික, අයපත් කෙනෙකු නොවන බව" පැවසුවේ කවු ද?

(viii) "පුත ඔබ නිතරම මා සමඟයි." මෙය පැවසුවේ කවු ද?

(ix) දෙවියන් වහන්සේ මැවූ සත්ව ලෝකයෙන් සතුන් දෙදෙනෙකු තෝරා අපට උගත හැකි පාඩම බැගින් දක්වන්න.

(x) පාපය යනු කුමක් ද? (ලකුණු 2 X 10 = 20)

(02) (i) මැවුම්කරුවාණන් සැපයුම්කරුවාණන්සේ අපට ජීවිතය පවත්වාගෙන යෑමට දී ඇති ස්වභාවික දෑ දෙකක් නම් කරන්න. (ලකුණු 2)

(ii) ඒදන් උයනේ මිනිසාට ජීවත්වීමට ලබාදීමෙන් දෙවියන් වහන්සේ බලාපොරොත්තු වූ කරුණු 3ක් දක්වන්න. (ලකුණු 3)

(iii) ඔබගේ ජීවිතය දේව සබඳතාවෙන් පවත්වා ගන්නා ආකාර තුනක් විස්තර කරන්න. (ලකුණු 5)

(03) (i) මා ඔබට කුමක් කර දෙනවාට ඔබ කැමති ද? මෙම වදන් ජේසුස් වහන්සේ පැවසුවේ කාට ද? (ලකුණු 2)

(ii) යහපත් සමරිතානුවරයාගේ උපමාවෙන් සමාරිය ජාතිකයා හැර අන් දෙදෙනා නම් කර ඔවුන් ක්‍රියා කළ ආකාරය දක්වන්න. (ලකුණු 3)

(iii) මෙම උපමාවෙන් අපට උගත හැකි පාඩම් 3ක් විස්තර කරන්න. (ලකුණු 5)

(04) (i) බයිබලයේ ගිවිසුමේ හා නව ගිවිසුමේ පොත් ගණන දක්වන්න. (ලකුණු 2)

(ii) බයිබලයේ අඩංගු සුභාරංචි පොත් තුනක් නම් කරන්න. (ලකුණු 3)

(iii) දුක්, කරදර මැද පීඩා විඳින ඔබේ මිතුරා / මිතුරිය වෙනුවෙන් කරන යැදුමක් ලියන්න. (ලකුණු 5)



agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

(05) (i) සාමුවෙල්ගේ මව හා පියා නම් කරන්න. (ලකුණු 2)

(ii) එඬේර ජීවිතය තුළ දාවිත්ගේ වීරත්වයන් දෙකක් විස්තර කරන්න. (ලකුණු 3)

(iii) දාවිත් මෙන් බාලවියේ පටන් අප තුළ තිබිය යුතු ගුණාංග තුනක් විස්තර කරන්න. (ලකුණු 5)

(06) (i) ජේසුස් වහන්සේ බවතීස්ම ස්නාපනය ලැබූ අවස්ථාවේ ස්වර්ගයෙන් නික්මුණු හඬ කුමක් ද? (ලකුණු 2)

(ii) පාළුකරයේ දී ජේසුස් වහන්සේට පැමිණි පරීක්ෂා දෙකක් විස්තර කරන්න. (ලකුණු 3)

(iii) ස්වාමීන් වහන්සේගේ යාච්ඤාවේ අප පරීක්ෂාවෙන් මිදීම සඳහා කෙරෙන ඉල්ලීම හා ඔබට පැමිණි පරීක්ෂාවකින් ජය ගත් අත්දැම දක්වන්න. (ලකුණු 5)

(07) මින් මාතෘකා 02ක් තෝරා කෙටි සටහන් ලියන්න.

(i) දේව මැවිල්ල තුළ ජලයේ ඇති වැදගත්කම.

(ii) ශාස්ත්‍රවන්තයින්ගේ පැමිණීම.

(iii) ජේසු කුමරුගේ ජීවිතයෙන් මා ලද වටිනාකම්

(iv) සුවය ලද ලාදුරු රෝගියා මම වෙමි.

(v) ජීවිතයේ පහන බයිබලයයි.

(ලකුණු 5 X 2 = 10)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk
agaram.lk